මගේ අංකය : DL/E/21/08/EN EB
ආයතන අංශය,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.
2020.06. 22

කම්කරු කොමසාරිස් (කර්මාන්ත සුරක්ෂිතතා අංශය)/
සියළුම දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන්,

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ දෙපාර්තමේන්තු/ආයතන ක්‍රම වේදයන් පිළිබඳ ලිඛිත පරීක්ෂණය - 2020**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන 1 වන **කාර්යක්ෂමතා කඩඉම්** පරීක්ෂණයට අදාල දෙපාර්තමේන්තු/ආයතන ක්‍රම වේදයන් පිළිබඳ ලිඛිත පරීක්ෂණය **2020 ජූලි** මස කම්කරු දෙපාර්තමේන්තුවේදී පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

02. මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රයේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.

03. ඔබ කාර්යාලයේ/අංශයේ සියළුම ඉංජිනේරු නිලධාරීන්ව මේ සම්බන්ධයෙන් දැනුවත් කර, මේ සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් (අංක 08 ඡේදයේ ඔබගේ නිර්දේශ සහිතව ) **2020.07.08** දිනට පෙර මා වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි.

04. මෙම පරීක්ෂණයට පළමු වරට ඉල්ලුම් කරන අපේක්ෂකයින්ගෙන් හැර අනෙකුත් සියළුම අපේක්ෂකයින්ගෙන් විභාග ගාස්තු ලෙස රු. 500/-ක මුදලක් අයකරනු ලැබේ.

05. 5.1. **ප්‍රාදේශීය කාර්යාල/උප කාර්යාල වලට විභාග ගාස්තු ගෙවීමේදී :** අපේක්ෂකයා විසින් පොදු 118 ආකෘති පත්‍රයේ විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය **"පොදු තැන්පත්"** ලෙස සටහන් කර මෙම නිවේදනයේ පිටපතක්ද සමග ගෙවීම් කරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල/උප කාර්යාලවල මුදල් අයකැමි වෙත ඉදිරිපත් කළ යුතුය.එම මුදල් ලබා ගැනීම වෙනුවෙන් නිකුත් කරනු ලබන රිසිට් පත (පොදු 172) ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටසේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

5.2. **ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත විභාග ගාස්තු ගෙවීමේදී :** අපේක්ෂකයා විසින් පොදු 118 ආකෘති පත්‍රයේ විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය **: 2003/02/99/C** ලෙස සම්පූර්ණ කර භාරදී එම මුදල් ගෙවීම වෙනුවෙන් රිසිට් පතක් (පොදු 172) සරප් වෙතින් ලබා ගත යුතුය.

**සටහන : සහකාර කම්කරු කොමසාරිස්වරුන්/ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන් විසින්**

ඉහත 5.1ට අදාලව ලැබෙන සෑම ලැබීමක්ම සේ.අ.අ. නොවන ලැබීමක් ලෙස පොදු තැන්පත් ලෙජරයට ගෙන, විභාග ගාස්තු වල මුළු එකතුවට සමාන තනි චෙක්පතක් කම්කරු කොමසාරිස් ජනරාල් නමින් නිකුත් කළ යුතුය. එම චෙක්පත රජයේ ආදායමට බැර කිරීමට ප්‍රධාන කාර්යාලය වෙත එවීමේදී ඊට අදාළ විස්තර ආයතන අංශයටද පිටපතක් සහිතව ප්‍රධාන ගණකාධිකාරී වෙත ලබාදිය යුතුය.

ජී.ඩබ්.එන්. විරාජි
කම්කරු කොමසාරිස් (පාලන)
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

ජී.ඩබ්.එන්. විරාජි
කම්කරු කොමසාරිස් (පාලන)

අත්:කලේ: ඒ. විමලවීර
කම්කරු කොමසාරිස් ජනරාල්

පිටපත : 01. ලේකම්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.
02. ප්‍රධාන ගණකාධිකාරී - අවශ්‍ය කටයුතු සඳහා
03. සියළුම සහකාර කම්කරු කොමසාරිස්වරුන් /ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන්

## කම්කරු දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ දෙපාර්තමේන්තු/ආයතන ක්‍රමවේදයයන් පිළිබඳ ලිඛිත පරීක්ෂණය 2020

අංක 1836/6 - 2013 නොවැම්බර් මස 11 වන දින අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව එම සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වනකාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ ඉහත සඳහන් පරීක්ෂණය 2020 ජූලි මස කම්කරු දෙපාර්තමේන්තුවේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

01 පරීක්ෂණයට අදාළ විෂයය :

| ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කර්මාන්තශාලා නීති හා කර්මාන්තශාලා පරීක්ෂණ | පැය 03 | 100 | 40 |

**02 අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

මෙම පරීක්ෂණයට පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂයින් මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව A 4 කඩදාසියක දෙපැත්තම පාවිච්චි කරමින්අංක 01 සිට 05 දක්වා ඡේද එක් පිටුවකටත්, ඉතිරි කොටස අනෙක් පිටුවටත් වන සේ සකසා ගත් අයදුම්පත්, අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතව <u>**2020.07.08 දින හෝ ඊට ප්‍රථම කම්කරු කොමසාරිස් ජනරාල්**</u> වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **"ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු/ආයතන ක්‍රමවේදයයන් පිළිබඳ ලිඛිත පරීක්ෂණය- 2020"** යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03.** මෙම පරීක්ෂණයට පළමුවරට ඉල්ලුම් කරන අපේක්ෂකයින්ගෙන් හැර අනෙකුත් සියළුම අපේක්ෂකයින් විභාග ගාස්තු ලෙස රුපියල් 500/= ක මුදලක් අය කරනු ලැබේ.

**04. විභාග ගාස්තු ගෙවීම :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර මෙම විභාග ගාස්තු කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත හෝ කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල/උප කාර්යාලවල මුදල් අයකැමි වෙත ගෙවා ලබාගත් ලදුපත ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටසේ අලවා එවිය යුතුය.

සැ.යු. ප්‍රධාන කාර්යාලයට විභාග ගාස්තු ගෙවනු ලබන අපේක්ෂකයින් - ලදුපත ලබා ගැනීමේදී සම්පූර්ණකළයුතු පොදු 118 ආකෘති පත්‍රයේ විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය 2003-02-99/C ලෙසද,

ප්‍රාදේශීය/උප කාර්යාලවලට විභාග ගාස්තු ගෙවනු ලබන අපේක්ෂකයින් - ලදුපත ලබා ගැනීමේදී සම්පූර්ණ කළ යුතු පොදු 118 ආකෘති පත්‍රයේ විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය පොදු තැන්පත් ලෙසද සඳහන් කරන්න.

(මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

| |
|---|
| සටහන : විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය. |

**05. විභාගයට පෙනී සිටීමට සුදුසුකම් :**

මෙම නිවේදනය සැලකිල්ලෙන් කියවා ඉල්ලා ඇති සියලුම තොරතුරු සම්පූර්ණ කර, අයදුම්පත් නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**06. විභාගයට ඇතුළත් කර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම :**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා තිබෙන සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් කම්කරු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලැබේ.

07. විභාගයට පෙනී සිටීම සඳහා පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් හෝ සංයුක්ත දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

ජී.ඩබ්.එන්. විරාජි
කම්කරු කොමසාරිස් (පාලන)

ජී.ඩබ්.එන්. විරාජි
කම්කරු කොමසාරිස් (පාලන)
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

අත්:කලේ: ඒ. විමලවීර
කම්කරු කොමසාරිස් ජනරාල්

දිනය : 2020.06. 22

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**කම්කරු දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ දෙපාර්තමේන්තු/ආයතන ක්‍රමවේදයන් පිළිබඳ ලිඛිත පරීක්ෂණය**

**2020**

01. 1.1 අයදුම්කරුගේ මුලකරු සමග නම : (සිංහලෙන්) . ..........................................

..........................................................................................................

1.2 අයදුම්කරුගේ මුලකරු සමග නම : (ඉංග්‍රීසියෙන්)..........................................

..........................................................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන්):..........................................................

..........................................................................................................

1.4 සම්පූර්ණ නම : (ඉංග්‍රීසියෙන්) :..........................................................

..........................................................................................................

02. 2.1 තනතුර :..........................................................................

2.2 එම තනතුරට පත් වූ දිනය : ..........................................................

03 3.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : (සිංහලෙන්) :......................................

..........................................................................................................

3.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසියෙන්)......................................

..........................................................................................................

3.3 රාජකාරී ස්ථානය හා එහි ලිපිනය :..........................................................

3.4 දූරකථන අංක : රාජකාරී : [ ] පුද්ගලික : [ ]

04. 4.1 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | | ]

4.2 උපන් දිනය : [ | | | ] [ | ] [ | ]

4.3 ස්ත්‍රී පුරුෂ භාවය : [ ]

05. 5.1 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]

06. 6.1 ඔබ මෙම පරීක්ෂණයට ඉල්ලුම් කරනුයේ පළමු වරට ද?

6.2 ඉහත 6.1 ට පිළිතුර "නැත" නම් නිවේදනයේ 03 ඡේදයට අනුව විභාග ගාස්තු ගෙවන ලද කාර්යාලය:

.......................................................................................................................

6.3 මුදල් ගෙවන ලද කුවිතාන්සියේ අංකය හා දිනය :

.......................................................................................................................

(මුදල් ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ එක් කෙළවරකින් මෙහි අලවන්න. එහි ඡායා පිටපතක් ඔබ ලග තබා ගන්න.)

07. අයදුම්කරුගේ ප්‍රකාශය :

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

(ආ) මෙම විභාගයට අදාළ සියලුම කොන්දේසි පිළිපැදීමට මම එකඟ වෙමි.

දිනය : අයදුම්කරුගේ/කාරියගේ අත්සන

---

**08 කාර්යාල/අංශ ප්‍රධානියාගේ නිර්දේශය :**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ඉහත අත්සන යෙදූ නිලධාරියා/නිලධාරිනිය මෙම කාර්යාලයේ/අංශයේ සේවය කරන බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය: කාර්යාල/අංශ ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව